**වයඹ පළාත් සභාව - 2022**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වයඹ පළාත් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 19 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1003-07-01 ආදායම් ශීර්ෂය වන සාත්තු නිවාස හා පෞද්ගලික ආරෝග්‍ය ශාලා ලියාපදිංචි ගාස්තු සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම වූ රු.1,347,750 ක් හා පසුගිය වර්ෂ 06 ක් වෙනුවෙන් ලැබිය යුතු ආදායම වූ රු.9,872,990 ක වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී ලැබෙන මුදල් මෙම ශීර්ෂය යටතේ ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත. | නිවැරදි ආදායම් ශීර්ෂ යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ප්‍රධාන ලේකම් - 260 වැය ශීර්ෂයේ ඒසීඒ 06 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ වැය විෂය 2102 ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ වටිනාකම රු.57,541,473 ක් ලෙස දක්වා තිබුණද පළාත් සභා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එම වටිනාකම රු.58,405,413 ක් ලෙස | මෙම වෙනස ඉදිරියේදී ගලපා වටිනාකම් නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | වත්කම්වල වටිනාකම නිවැරදිව හඳුනාගත යුතුය. |

දැක්වීමෙන් පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් වල වටිනාකම රු.863,940 ක් වැඩියෙන් දැක්විණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව වයඹ පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂ අංකය 201 - වයඹ ආණ්ඩුකාරවරයා

#### 1.5.1.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 ජුලි 01 දින සිදුවූ වාහන අනතුරට අදාළව 2022 ජුනි 15 දින නිකුත් කරන ලද අවසන් පරීක්ෂණ වාර්තාව අනුව රු. 1,420,728 ක මුදලක් රියදුරුගෙන් අයකර ගැනීමට තීරණය වුව ද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එකී මුදල් අයවී නොතිබුණි. | නඩු පැවරීමට කටයුතු කරනු ලැබේ. | රජයට සිදුවූ පාඩුව අයකර ගැනිමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශීර්ෂ අංකය 203 - වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

#### 1.5.2.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ විනය පරීක්ෂණ ගොනු 15 ක කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණි. | කාල ප්‍රමාදයන් ඇති පරීක්ෂණ 03 ක් පවතින අතර, පරීක්ෂණ 07 ක් දැනට සිදු කරමින් පවතිනු ඇත. පරීක්ෂණ 05 ක් අවසන් කර ඇත. | විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් නිම කිරිමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | චෝදනා පත්‍ර නිකුත් කිරීම හා විනය නියෝග ලබාදීම අතර වසර 02 ත් වසර 06 ත් අතර කාල ප්‍රමාදයක් පවතින අවස්ථා 07 ක් නියැදි පරීක්ෂාවේදී හඳුනාගත හැකිවිය. | කාල ප්‍රමාදයන් සහිත පරීක්ෂණ 7න් මේ වන විට පරීක්ෂණ 03 ක් නිමකර විනය නියෝග ලබාදීමට කටයුතු කරමින් ඇත. | කාල ප්‍රමාදයකින් තොරව විනය නියෝග ලබාදීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 ශීර්ෂ අංකය 210 - වයඹ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යවරයා**

**1.5.3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාසල් සිසුන් වෙත සහනදායී මිලට අභ්‍යාස පොත් බෙදා දීමේ ව්‍යාපෘතිය යටතේ අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අලෙවි කිරීම සඳහා අධ්‍යාපන කාර්යාල, පාසල් හා විවිධ ආයතන වෙත ලබා දී තිබූ රු.34,241,700 ක් වටිනා අභ්‍යාස පොත්වලට අදාළව එම ආයතන වෙතින් තවදුරටත් ලැබිය යුතු මුදල රු.4,627,877 ක් විය. | අදාළ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම (Out Put)ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 වර්ෂයෙහි පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.මිලියන 10 ක ප්‍රතිපාදන මත ගිවිසුම්ගත, වයඹ ජනකලා පදනමේ පැරණි ශ්‍රවණාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සමාලෝචිත වර්ෂය දක්වාම නිමකර නොතිබුණි. | තොරතුරු ප්‍රධාන අමාත්‍යාංශයේ සැලසුම් අංශයෙන් ලද වහාම ලබා දීමට කටයුතු කරමි. | කාලීනව නිමකළ යුතුය. |
| (ආ) | වයඹ ජනකලා පදනමේ නව ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා 2019 වර්ෂය වන විට රු.139,449,306 ක් වැයකර පැවතියද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම එහි ඉදිකිරීම් අවසන්ව නොතිබුණි. එමෙන්ම රු.7,780,112 ක් වැයකර ස්ථාපිත කර තිබූ ට්‍රාන්ස්ෆෝමරයද, පිළිවෙලින් රු. 8,304,789 ක් හා රු.11,456,578 ක් වැයකර ඉදිකර තිබූ වතුර ටැංකියද, | මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කමිටුව කොන්ත්‍රාත්තුව සඳහා නැවත මිල ගණන් කැඳවා නැවත කොන්ත්‍රාත්තුව පිරිනැමීම සුදුසු බව තීරණය කර ඇත. | අදාළ ඉදිකිරීම් කඩිනමින් නිමකිරීමට කටයුතු කළ යුතුය. |

උපස්ථාන ගොඩනැගිල්ලද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිශ්කාර්යව පැවතුණි.

**1.5.4 ශීර්ෂ අංකය 211 - වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව**

**1.5.4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගණකාධිපති විසින් 2009 – 2014 ත් අතර කාල පරාසය තුළ නිකුත් කර තිබුණු රු.3,325,756 ක් වූ අධිභාර සහතික 07 ක් සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අධිභාර සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා පනතේ 172(9)(8) හෝ 172 (10) වගන්තිය පරිදි කටයුතු කරන ලෙස දන්වා ඇති අතර, මේ පිළිබඳ ප්‍රාදේශීය සභා ලේකම්වරු දැනුවත් කර ඇත. | අධිභාර අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.5 ශීර්ෂ අංකය 213 - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**1.5.5.1 කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වර්ෂයේ වයඹ පළාත් විභාග ප්‍රතිඵල අනෙකුත් පළාත් විභාග ප්‍රතිඵල සමඟ සැසදීමේ දී , පහ වසර ශිෂ්‍යත්ව ප්‍රතිඵල අනුව 6 වන ස්ථානයේ ද සාමාන්‍ය පෙළ ප්‍රතිඵල අනුව 8 වන ස්ථානයේ සහ උසස්පෙළ ප්‍රතිඵල අනුව හතර වන ස්ථානයේ පැවති අතර, මෙම ප්‍රතිඵලය 2020 වර්ෂයේ දී පිළිවෙලින් තුන්වන,අටවන හා පළමුවන ස්ථානයේ විය. | පාසල් පැවැත්වීමේ දින ගණන සීමා වීම, එසේ ම කොට්ඨාස කලාප හා පළාත් මට්ටමේ අධීක්ෂණය සඳහා අවස්ථාව නොලැබීම, සිසු ඇගයීම සඳහා වාර විභාග හෝ අනාවරණ පරීක්ෂණ පැවැත්වීමට නොහැකි වීම, ආදී කරුණු හේතු වී ඇත. | වයඹ පළාතේ සමස්ත ප්‍රතිඵල ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. |

**1.5.5.2 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වාරියපොළ පුහුණු මධ්‍යස්ථානයේ විශේෂ අධ්‍යාපන ඒකකයේ පවතින දරුවන්ගේ ශ්‍රවණ, අක්ෂි හා බුද්ධි මට්ටම් ඇතුලු පරීක්ෂාවන් ගණනාවක් සිදු කළ හැකි උපකරණ හා උපාංග 318 ක් පමණ වසර | මෙම මධ්‍යස්ථානය භාරව සිටි ගුරු මහතාගේ විශ්‍රාම යාමෙන් පසු වෙනත් සුදුසු ගුරුවරයෙකු පත්කිරීමට නොමැතිවීම මීට හේතු වී ඇති අතර, තාවකාලික පිළියමක් ලෙස ගුරු | උපකරණ අදාළ අරමුණට උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| 10 කට වැඩි කාලයක සිට භාවිතා නොකර නිෂ්කාර්යයව පැවතුණි. | උපදේශකවරුන් පත්කර ක්‍රියාකාරී මට්ටමින් පවත්වාගෙන යාමට කටයුතු කර ඇත. | |

**1.5.5.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------------------------- | ------------------------------------- | ----------------------- |
| **(අ)** | අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති සිද්ධි 30 කට අදාළ එකතු වටිනාකම රු.4,175,496 ක් විය. මින් රු.1,670,940 ක් වටිනා සිද්ධි 10 කට වසර 5 ට වැඩි කාලයකට අදාළ විය. | මින් කොටසක් කපා හැර ඇති අතර ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | 2020 ජනවාරි මස අනතුරට පත් වූ වාහනයක් රු.1,436,000 ක් වියදම් දරා අලුත්වැඩියාකර තිබුණි. උක්ත වාහනය පූර්ණ රක්ෂණය සිදුකර තිබුණද රියදුරුගේ බීමත්කම යන කාරණාව තුළ රක්ෂණ වන්දි ලබා දීම ප්‍රතික්ෂේපකර තිබුණු නමුත් රියදුරුට අදාළ විනය නියෝගයක් ලබාදීම සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදුව නොතිබුණි. | අදහස් දැක්වීම් සිදුකර නැත. | පළාත් මූල්‍ය රීති ප්‍රකාරව පරීක්ෂණ කඩිනම් කර වයඹ පළාත් සභා අරමුදලට සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | 2007 සිට 2010 වර්ෂය දක්වා කාලසීමාව තුලදී ගිරිඋල්ල කලාප අධ්‍යාපන කාර්යාලයේ දී සිදුවී තිබුණු මූල්‍ය අක්‍රමිකතාවයට අදාළ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අවසන්ව නොතිබුණු අතර, පළාත් සභා මූල්‍ය ප්‍රකාශන අනුව මීට අදාළව අයකරගත යුතු මුදල රු.13,609,655 ක් විය. | ගිරිඋල්ල මහජන බැංකුවේ නිළධාරීන් කිහිපදෙනෙකුගේ නොසැලකිලිමත්භාවය හේතුවෙන් වංචා කිරීමට අවකාශය සැලසී ඇති බව විමර්ශන මගින් අනාවරණය වී ඇත. එබැවින් වයඹ ප්‍රධාන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් සාකච්ඡා වට 03 ක් මහජන බැංකුවේ නිලධාරීන් සමඟ පවත්වා ඇත. | අදාළ විමර්ශනයන් කඩිනමින් සිදුකළ යුතුය. |

**1.5.5.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------------------------- | ------------------------------------- | ----------------------- |
| වයඹ පළාත තුළ විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ගේ හිඟයක් පැවතිය ද, එවැනි ගුරුවරුන් 20 දෙනෙකු විශේෂ අධ්‍යාපන පන්ති කාමරයක් නොමැති පාසල්වලට අනුයුක්තව වෙනත් විෂයන් දීර්ඝ කාලයක සිට ඉගැන්වීම් සිදු කරනු ලබන බව | වයඹ පළාත් පාසල්වල සිටින ගුරුභවතුන්ට අදාළ විශේෂ අධ්‍යාපන ඒකක සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කරනු ඇත. | වයඹ පළාත තුළ විශේෂ අධ්‍යාපන ගුරු හිඟයක් පවතින බැවින් එකී ගුරුවරුන් අදාළ පාසල් වලට යොමු කළ යුතුය. |

විගණනයේදී සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව හඳුනාගත හැකිවිය. එම එක් එක් ගුරුවරුන් පාසලට අනුයුක්ත කළ කාලය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

## 1.5.6 ශීර්ෂ අංකය -221 - වයඹ පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1.5.6.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43 (i) වගන්තිය අනුව සෑම ලියාපදිංචි සමිතියක්ම රෙජිස්ට්‍රාර්තුමා විසින් නියම කරන ලද පරිදි වාර්ෂික ශුද්ධ ලාභයෙන් සියයට 10 කට වැඩි නොවන සහ රු.500 කට අඩු නොවන මුදලක් සමුපකාර අරමුදලට දායක මුදල් වශයෙන් වර්ෂයක් පාසා අයවිය යුතු වුවත්, සමුපකාර සහකාර කොමසාරිස් කොට්ඨාශ හතරෙහි සමිති වෙතින් සමුපකාර අරමුදලට අයවීමට පවතින මුදල රු76,701,822 ක් විය. | සක්‍රීය සමිති වලට අදාළ මුදල් ගෙවන ලෙස දැනුම් දී ලිපි යවා ඇති බවත්, අක්‍රීය සමිති ඈවර කිරීමේ දී වත්කම් වලට හිලවු කිරීමටත් කටයුතු කරනු ලැබේ. | සමූපකාර සමිති පනත අනුව සමූපකාර අරමුදලට දායක මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමුපකාර සහකාර කොමසාරිස් කොට්ඨාශ දෙකක පිහිටි සමුපකාර සමිතිවල රු.98,992,459 ක මුදල් වංචා හෝ මුදල් අඩුවීම් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වාර්තා වී තිබුණ ද ඊට අදාළ විමර්ශනයන් සිදුකිරීම දුර්වලමට්ටමක විය. | සමිති 05 ක මුදල් අයවෙමින් පවතින අතර, සමිති 09 කට අදාළව නෛතික ක්‍රියාමාර්ග ද, සමිති 03 කට අදාළව බේරුම් කටයුතු ද සිදුකරනු ඇත. සමිති 03 කට අදාළ වගකිවයුතු අය මියගොස් ඇති බැවින් හා එක් සමිතියකට අදාල පාඩුව තහවුරු කර ගැනීමට නොහැකි වී ඇත. | අදාළ විමර්ශන කටයුතු කඩිනමින් නිමකළ යුතුය. |

### 1.5.7 ශීර්ෂ අංකය - 222 - වයඹ පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

#### 1.5.7.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------------------------- | --------------- |
| (අ) | නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අදාළව එළදා බදු හා වාර්ෂික ඉඩම් බදු යටතේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ බදු මුදල රු.3,367,201 ක් විය. | හිඟ බදු මුදලින් කොටසක් අය වී ඇති අතර ඉතිරි හිඟ බදු මුදල් අය කර ගැනීමට කටයුතු කරනු ඇත. | බදු මුදල් අදාල කාලය තුළ අයකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | දීර්ඝකාලීන ඉඩම් බදු යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශ 10 ක අවස්ථා 17 කට අදාලව වසර 01 සිට වසර 12 ක කාල පරාසයකට අදාලව සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයවීම් හිඟ හිට ඇති බදු මුදල රු.97,804,188 ක් විය. | හිඟ පවතින ආයතන දැනුවත් කිරීම, අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම, වාරික වශයෙන් අයකිරීම, බදු ගිවිසුම් අවලංගු කිරීම වැනි ක්‍රියාමාර්ග ගනිමින් ඇත. | අදාල බදු මුදල් කාලීනව රැස් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.8 ශීර්ෂ අංකය - 231 - වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

#### 1.5.8.1 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව හා අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------------------------------ | ------------------------------- | ------------- |
| 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීම්) පනතේ 3 (5) වගන්තිය ප්‍රකාරව පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව මගින් අයකරනු ලබන ගාස්තු මුදලින් සියයට 50 ක ප්‍රතිශතයක් අදාළ පළාත් සභාව වෙත ගෙවීම් කළ යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දිනට රු.1,347,750 ක මුදලක් අය කර ගැනීමට පැවතුණි. | 2022 වර්ෂයට අදාල ලැබිය යුතු රු.1,347,750 මුදල ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරනු ලැබේ. | පනත ප්‍රකාරව අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.8.2 කළමනාකරණ ආකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------------- | ------------- |
| (අ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඖෂධ අවශ්‍යතාව වෙනුවෙන් 2014 සිට 2022 කාලය තුළ වෛද්‍ය සැපයුම් අංශය (MSD) වෙතින් කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය කාර්යාලය වෙත ලැබී තිබූ ඖෂධ වලින් රු. 15,226,949 ක් වටිනා ඖෂධ හා වටිනාකම හඳුනාගත නොහැකි 37,716 වූ ශල්‍ය ද්‍රව්‍ය තොගයක් තත්ත්වයෙන් අසමත්ව පැවති අතර ඒවා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ඉවත් කිරීමට කටයුතු නොකර පැවතුණි.. | වෛද්‍ය සැපයුම් අංශය මගින් ඖෂධ ඉවත් කරන ක්‍රමවේදය දැනුම් දුන් පසු මෙම ඖෂධ ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | තත්ත්වයෙන් අසමත් වූ ඖෂධ හා ශල්‍ය ද්‍රව්‍ය ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | නිකවැරටිය, අලව්ව, මාවතගම රෝහල්වල 2021 හා ඊට පෙර වර්ෂවලදී කල් ඉකුත්ව ඇති රු.3,408,612 ක වටිනාකමැති ඖෂධ සහ පුත්තලම දිස්ත්‍රික් ඖෂධ ගබඩාවේ 2021 ගබඩා සමාංක වාර්තා අනුව රු.1,740,825 කට ආසන්න කල් ඉකුත් වූ ඖෂධ වර්ග 19 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඉවත් කිරීම් කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වූ ඖෂධ සම්බන්ධයෙන් අපහරණ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. | කල් ඉකුත් වූ ඖෂධ ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.8.3 නිශ්කාර්ය හා ඌණ උපයෝජිත වත්කම්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------------- | ------------- |
| (අ) | මාරවිල මූලික රෝහලේ බාහිර රෝගී අංශය ජාලගත කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2019 වර්ෂයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ ලැප්ටොප් පරිගණක 09 ක්, ප්‍රින්ටර් 07ක්, බාකෝඩ්රීඩර් 25 ක් ඇතුළු උපකරණ සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම භාවිතයට නොගෙන ගබඩාවේ තබා තිබුණි | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරගෙන යාම සඳහා අවශ්‍ය පරිගණක දැණුම ඇති පුහුණු කාර්ය මණ්ඩලයේ හිගය මීට හේතු වී ඇත. | අවශ්‍ය පුහුණු කාර්යමණ්ඩල ලබාගෙන ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු කරා ළඟා විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුත්තලම මූලික රෝහල වෙත 2017 වර්ෂයේදී වෛද්‍ය අංශ අතර ජාලගතකරණය සඳහා ලැප්ටොප් පරිගණක 33 ක් ලැබී තිබූ අතර එයින් අංශ 16 ක් වෙත පරිගණක 26 ක් පමණක් බෙදා හැර තිබුණි. බෙදාදුන් පරිගණක ඇතුළු සියලු පරිගණක සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිශ්කාර්යව පැවති අතර මේවායෙහි වගකීම් කාලයන්ද ඉක්මවා ගොස් පැවතුණි. | ප්‍රමාණවත් වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාවක් යෙදවීමට තිබූ ගැටලුව නිසා මෙහි යම් ප්‍රමාදයක් සිදු වි ඇති අතර ඉදිරියේදී අඩු පාඩු සම්පූර්ණ කර වැඩසටහන ආරම්භ කිරීමට කටයුතු සැලසුම් කර ඇත. | අදාළ උපකරණ භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 1.5.9 ශීර්ෂ අංකය - 232 - වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව

### 1.5.9.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | -------------------------------------- | ------------ |
| නාරම්මල ආයුර්වේද රෝහලේ ඖෂධ නිෂ්පාදනාගාරය සඳහා රු.806,095 ක පිරිවැයක් දරා 2021 වර්ෂයේ ස්ථාපිත කර තිබූ ගෑස් උදුන් පද්ධතියක් සහිත ගෑස් කාමරය සහ රු.504,624ක පිරිවැයක් දරා ඉදිකර තිබූ හෙද නිලධාරි විවේකාගාරය සමාලෝචිත වර්ෂය දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | ගෑස් සිලින්ඩර් ලබා ගැනීමෙන් අනතුරුව ප්‍රයෝජනයට ගනු ලැබේ. නාරම්මල ආයුර්වේද රෝහල මූලික රෝහලක් කිරීම සඳහා ඉල්ලීම් කර තිබූ නිසා හෙද නිලධාරි විවේකාගාරය හා කාමරය ඉදිකර ඇත. | අදාළ වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.10 ශීර්ෂ අංකය - 243 - වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1.5.10.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | ---------------------------- | ------------ |
| වලකුඹුර මැටි නිෂ්පාදන හා පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ 2020 වර්ෂයේදී රු.9,727,058 ක වියදමක් දරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ව්‍යාපෘතිය නිමකර නොතිබුණි. | ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂයේදී නිම කිරීමට සැලසුම් කර ඇත. | අප්‍රමාදව නිමකිරීම් සිදුකර අදාළ කාර්ය සඳහා යෙදවීමට කටයුතු කළ යුතුය. |

### 1.5.10.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | --------------------------------- | ------------- |
| (අ) | කොස්හේනාගාර, මිරිහානේගම, වෙන්නරුව, කොස්ගහ ඇල හා රන්දෙණිගම යන පේෂ මධ්‍යස්ථාන වලට අයත් අබලන් වූ ගොඩනැගිලි පහක් පවතින අතර වර්තමානය වනවිට එම මධ්‍යස්ථාන නිෂ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි. | මෙම ගොඩනැගිලි පිහිටි ඉඩම් රජයේ ඵලදායී කටයුත්තක් සඳහා භාවිතා කිරීම සඳහා ප්‍රාදේශිය ලේකම් වෙත වාර්තා කිරීමට කටයුතු කර ඇත. | අදාළ ගොඩනැගිලි ප්‍රයෝජනවත් කාර්යයකට යෙදිය යුතුව ඇත. |
| (ආ) | ගොඩවෙල අපජල පිරිපහදු පද්ධතිය නවීකරණය කිරීම සඳහා උපමාන පාදක ප්‍රතිපාදන හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන යටතේ සමාලෝචිත වර්ෂය තුළදී රු.3,148,922 ක මුදලක් වැයකර පැවතියද අළුත්වැඩියා කටයුතු නිසිපරිදි ඉටුනොවීම හේතුවෙන් වර්තමානය වනවිට පිරිපහදු පද්ධතිය නිෂ්ක්‍රියව පැවතුණි | නැවත ප්‍රසම්පාදන කටයුතු සිදුකර අදාල කාර්යය සිදු කරන ලෙස ප්‍රධාන ලේකම් සමඟ 2023.05.10 දින පැවති රැස්වීමේදී තීරණය කර ඇත. | පිරිපහදු පද්ධතිය කඩිනමින් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.10.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ----------------------------- | ------------- |
| (අ) | පේෂකර්ම මධ්‍යස්ථාන 04 ක් නගා සිටුවීමේ අරමුණින් එම මධ්‍යස්ථාන වෙත ලබාදීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.2,048,400 ක් වටිනා බතික් අත්යන්ත්‍ර 20ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ලැබී තිබූ අතර විගණන අවස්ථාව වූ 2023 මැයි දින වන විටත් එම යන්ත්‍ර බෙදා හැරීමට කටයුතු නොකර මල්කඩුවාව තොග ගබඩාවේ පැවතුණි**.** | අබලන් වූ පේෂකර්ම මධ්‍යස්ථාන නවීකරණය කොට ආරම්භ කිරීමෙන් පසු එම යන්ත්‍ර බෙදා දීමට කටයුතු කරනු ඇත. | අරමුණුගත කාර්යයන් සඳහා යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුව සතු ජනසළු මධ්‍යස්ථාන 4 ක සිදුව තිබූ රු. 3,206,282ක මූල්‍ය වංචා හා තොග ඌනතාවයන් සම්බන්ධ විමර්ශණ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිමව නොමැති අතර, විමර්ෂණ වාර්තා අනුව අවස්ථා 4 කට අදාලව අයකර ගත යුතු රු.643,01 ක මුදලක්ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අයකරගෙන නොතිබුණි. | නැවත පරීක්ෂණ පැවැත්වීමට හා අදාල නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත. | අදාළ කටයුතු අප්‍රමාදව අවසන් කළ යුතුය. |

## 1.5.11 ශීර්ෂය 251 - වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### 1.5.11.1 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ---------------------------------- | ----------- |
| (අ) | වටිනාකම හඳුනාගෙන නොමැති ජපන් ආධාර යටතේ 2013 වර්ෂයේ ලැබී තිබූ හාවස්ටර් වර්ගයේ ගොයම් මඩින යන්ත්‍රයක් එම වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම වාරියපොල ගොවිපල පරිශ්‍රයේ ගාල්කර ඇත. | මෙම යන්ත්‍රය කුරුණෑගල ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට භාර දිමට කටයුතු කරමින් ඇත. | අදාල වත්කම් ඵලදායී ලෙස භාවිතා කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් ගල්ගමුවේ රජයේ ගොවිපලේ අක්කරයක කෙසෙල් වගාව සඳහා රු.310,000 ක වියදමින් ජල විසුරුම් පද්ධතියක් 2022 වර්ෂයේ දී ස්ථාපනය කර තිබුණි. 2023 ජනවාරි 20 දින සිදුකළ භෞතික පරීක්ෂාවේ දී ජල විසුරුම් පද්ධතිය අක්‍රිය තත්ත්වයේ පැවතුණි. | එම පද්ධතිය හා සම්බන්ධ ප්‍රධාන ජල පොම්පය අක්‍රියවීම නිසා ජල සම්පාදන පද්ධතිය භාවිතයට ගත නොහැකි වී ඇත. | ජල විසුරුම් පද්ධතිය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.11.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ----------------------- | ------------------------------ | ------------ |
| දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 31 දින රු.15,930,000 ක් වැයකර මිලදීගෙන තිබූ Solar Power Daler 50 න් කුරුණෑගල හා වාරියපොල කෘෂිකර්ම කලාප කාර්යාලවලට ලබාදී තිබූ පිළිවෙලින් | ගොවින්ගේ දායකත්වය නොලැබීම මීට හේතුවී ඇත. ගොවින් මුදල් ගෙවීමෙන් පසු යන්ත්‍ර ලබා දීමට කටයුතු කරනු ඇත. | අදාල වත්කම් අරමුණුගත කාර්යයන්ට යෙදවීමට කටයුතු කළ යුතුය. |

යන්ත්‍ර 04 ක් හා 07 ක්ද වාරියපොල ගොවිපලට ලබාදී තිබූ යන්ත්‍ර 08 ක්ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ගොවීන් වෙත බෙදා හැර නොතිබුණි. ගොවීන් වෙත ලබාදුන් යන්ත්‍ර 31 ද ඵලදායී ලෙස භාවිතවේද යන්න පිළිබඳ දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කර ඇති බවක්ද හඳුනාගත නොහැකි විය.

### 1.5.12 ශීර්ෂ අංකය 260 - වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලය

#### 1.5.12.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------------- | ------------ |
| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ හිඟ ආදායම් ප්‍රකාශයට අනුව ආදායම් සංකේත අංක 1002-04-03 දරන රා තැබෑරුම් රේන්දය හා අංක 1002-04-05 දරන මෙරට මත්පැන් බලපත්‍ර වලට අදාළ වර්ෂ 03 කට වඩා පැරණි හිඟ ආදායම පිළිවෙලින් රු.15,886,819 ක් හා රු.800,000 ක් විය. | වසර 03 කට වඩා වැඩි හිඟ ශේෂයන් සඳහා ලිපි මඟින් හා දුරකථන මඟින් ද දැනුවත් කර ඇත. එලෙස අයකර ගත නොහැකි පාර්ශවයන් වෙනුවෙන් නිතීමය ක්‍රියාමාර්ග ගනු ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

#### 1.5.12.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------------------- | ------------ |
| වයඹ පලාත් සභාවේ CCTV පද්ධතිය වසරකට වැඩි කාලයක සිට අක්‍රීය තත්ත්වයේ පවතින අතර, යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. | CCTV කැමරා පද්ධතිය සක්‍රීය කිරීම සම්බන්ධයෙන් පරීක්ෂාකර වාර්තාවක් ලබාදෙන ලෙස SLT ආයතනය වෙත දැනුම්දෙන ලදී. ඒ අනුව දැනට සවිකර ඇති කැමරා පද්ධතිය කල් ඉකුත්වූ තාක්ෂණයක් වන බැවින් ඒ සඳහා නව තාක්ෂණයට ගැලපෙන යෝජනාවක් එම ආයතනය මඟින් ඉදිරිපත් කර ඇත. | කැමරා පද්ධතිය සක්‍රීය කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.13 ශීර්ෂ අංකය 262 - වයඹ පළාත් ප්‍රතිපත්ති, සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව

#### 1.5.13.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------------------- | ------------ |
| (අ) | පළාත් ආයෝජන වැඩසටහන සඳහා අන්තර්ජාලය පදනම් කරගත් තොරතුරු කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2018 සැප්තැම්බර් 01 දින එළැඹි ගිවිසුම අනුව 2019 මාර්තු 31 දින වන විට වැඩ අවසන් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘති නිම නොවී 2020 වසරේ පැවති නිමවුම් තත්ත්වයේම වූ අතර, 2020 දෙසැම්බර් 31 දින වන විට මේ වෙනුවෙන් වැයකර තිබූ මුදල රු.3,803,156 ක් විය. | සංවර්ධන සැලැස්මේ ව්‍යූහාත්මක සැලැස්ම සැකසීමට විශාල කාලයක් ගත වීම හේතුවෙන් ගිවිසුම් ගත කාලය තුළ නිම කිරීමට නොහැකි විය. | අදාළ සැලැස්ම කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වයඹ පළාත් පස් අවුරුදු මධ්‍යකාලීන සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන යටතේ 2017 වර්ෂයේ ලද ප්‍රතිපාදන වලින් රු.9,821,000 ක් වියදම් දරා තිබුණි. එහෙත් පස් අවුරුදු සැලැස්ම 2020 වර්ෂයේ සිට 2024 වර්ෂය සඳහා කාල පරිච්ඡේදයට අදාළව සකසා තිබුණද, අදාළ කාල පරිච්ඡේදයෙන් අඩකට වඩා ගතවී තිබුණද, සැලසුම අනුව අදාළ අරමුණු ඉටුකර ගැනීම් ප්‍රමාණවත් මට්ටමක නොවීය. | සංවර්ධන සැලැස්මේ ඉංග්‍රීසි මුද්‍රිත පිටපත් 480 ක් පමණ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් අප වෙත ලබා දී තිබූ අතර, වයඹ පළාතේ සියළුම පළාත් රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත ආයතන, සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල (46) එසේම මධ්‍යම රජයේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සියල්ල වෙත ලබා දී ඇත. | පස් අවුරුදු සංවර්ධන සැලැස්මෙහි ඉලක්ක හා අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.14 ශීර්ෂ අංකය 263 - වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

#### 1.5.14.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------------------- | ------------ |
| ආදායම් සංකේත දෙකක් යටතේ සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ආදායම රු.116,926,499 ක් විය. මින් රු.89,717,594 ලෙස සියයට 77 ක් ම දේපළ පැවරීම මත අතිරේක මුද්දර බදු වූ අතර එයින් රු.52,442,219 ක් ලෙස | දේපල පැවරීම මත අතිරේක මුද්දර ගාස්තු හිඟ ශේෂය රු.30,473,720 ක් අය කිරීම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත. පිරිවැටුම් බදු හිඟ ශේෂයෙන් රු.27,208,855 ක් අය කර තව දුරටත් රු.7,283,978 ක් කපා හැර ඇත. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

සියයට 58 ක්ම 2021 වසරට පෙර වර්ෂවලට අදාළ හිඟ විය. ව්‍යාපාරික පිරිවැටුම් බදු යටතේ පැවති රු.27,208,855 ක් වූ මුළු හිඟ බදු මුදලම 2021 වසරට පෙර වර්ෂවලට අදාළව විය. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුළ ආදායම් සංකේත දෙකකට අදාළ රු.13,384,385 ක හිඟ ආදායමක් කපාහැර තිබුණි.

### 1.5.15 විෂයය අංක 24302 - වඩු වාණිජ අත්තිකාරම් ගිණුම

#### 1.5.15.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාතේ දේශීය හා සාම්ප්‍රදායික කර්මාන්ත ප්‍රවර්ධන හා පැවැත්වීමට අවශ්‍ය පුහුණුව හා පහසුකම් සැපයීම මෙම අත්තිකාරම් කටයුත්තේ අරමුණක් වුවද වඩු පාසැල් 11 න් 06 කද, ජනකලා ආයතන 04 න් 01 කද සහ ලුහු ඉංජිනේරු ආයතන 03 න් 01 කද සමාලෝචිත වර්ෂයේ කිසිදු පුහුණුවක් සිදු කර නොතිබුණි. එමෙන්ම ඉතිරි වඩු පාසැල් 05 හි ජනකලා කලා ආයතන 03 හි හා ලුහු ඉංජිනේරු ආයතන 03හි සමාලෝචිත වර්ෂයේ පුහුණුව ලැබූ සංඛ්‍යාව පිළිවෙලින් 14 දෙනෙකු, 04 දෙනකු හා 08 දෙනෙකු පමණක් විය. | තරුණ ප්‍රජාවගේ පවත්නා ආකල්ප මත මෙම මධ්‍යස්ථාන වෙත යොමු වීමේ සීඝ්‍ර අඩුවීමක් මෙන්ම උපදේශකවරුන්ගේ හිඟයද මෙයට බලපා ඇත. | නව පාඨමාලා හඳුන්වාදෙමින් පුහුණුවීම් කටයුතු සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

#### 1.5.15.2 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණයගැති කාල විශ්ලේෂණය අනුව වසර 10 කට වැඩි කාලයක සිට පැවත එන 93 දෙනෙකුගෙන් අයවිය යුතු ණයගැති ශේෂය රු.2,102,970 ක් විය. | වර්ෂ 10 ට වඩා පැරණි ණය ශේෂ සම්බන්ධයෙන් මාණ්ඩලික නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇත. එම නිර්දේශ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකරනු ඇත. | හිඟ ණය ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

### 1.5.16 විෂයය අංක 24303 - පේෂ කර්මාන්ත වාණිජ අත්තිකාරම් ගිණුම

#### 1.5.16.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ණයගැති ශේෂය රු.46,549,904 ක් වූ අතර ඒ තුළ වර්ෂ 02 සිට 24 දක්වා කාලයක සිට අයවිය යුතු රු.9,880,130 ක ශේෂයක් ද විය. | පුද්ගල හා ඉන්වොයිස් ණයගැතියන් සම්බන්ධයෙන් පළාත් භාණ්ඩාගාරය විසින් ඉදිරිපත් කරන නිර්දේශ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. 2012 වර්ෂයේ ණය ශේෂය සම්බන්ධයෙන් නීතිපති වෙත අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා යොමු කර ඇති අතර, 2013 හා 2014 වර්ෂ වල ණය ශේෂ සඳහා විධිමත් විනය පරීක්ෂණ පවතිනු ලැබේ. | හිඟ ණය ශේෂ පිළිබඳ විසඳුමක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.17 විෂයය අංක 25002 - ව්‍යවසායකත්ව සංවර්ධන සේවා ඒකාබද්ධ අභිජනන ගොවිපල මාවතගම

#### 1.5.17.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2007 මැයි 04 දිනැති ලිපියේ උපදෙස් පරිදි මාවතගම ප්‍රාදේශීය ලේකම් විසින් 2007 මැයි 16 දින කිරිගව අභිජනන මධ්‍යස්ථානයක් හා පුහුණු ගොවිපලක් ඇති කිරීම සඳහා මාවතගම ඩෙනවර්වත්ත ඉඩමෙන් අක්කර 119 පර්චස් 12 ක් වයඹ පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුවට පවරා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඉඩම පවරාදීමේ අරමුණු ළඟාකර ගෙන නොතිබුණි. | ඉඩම පවරාගත් අරමුණද ඉටු වන අයුරින් පැල්වත්ත ඩේරි ඉන්ඩස්ට්‍රීස් (පුද්) සමාගම වෙත අක්කර 15 ක් සහ නාවික හමුදාව වෙත අක්කර 88 රූඩ් 02 පර්චස් 16ක් පවරාදීමට කටයුතු කරනු ලැබේ. | අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කළ යුතුය. |

**1.5.18 විෂයය අංක 25003 වාරියපොල පටක රෝපණ විද්‍යාගාරය**

**1.5.18.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොරෝනා වෛරස් නිරෝධායන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක වූ වාරියපොල පටක රෝපණ විද්‍යාගාරය 2020 වර්ෂය අවසානය දක්වාම නැවත පටක රෝපන විද්‍යාගාරයක් ලෙස ආරම්භකර නොතිබුණි. නව පටක රෝපණ විද්‍යාගාරයක් මාවතගම ඩෙනවර්වත්ත රජයේ ගොවිපල ඉදිකිරීමට 2019 වර්ෂයේ ආරම්භ කර රු.20,760,503 ක් වැයකර තිබුණද එහි ඉදිකිරීම් ද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම සිදුකර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් මාවතගම ඩෙනවර්වත්ත පටක රෝපණ විද්‍යාගාරය භාරදීමේ දී සියළු ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබීම, විද්‍යාගාරය සඳහා විදුලි සැපයුමක් ලබාගෙන නොතිබීම වැනි හේතු නිසා විද්‍යාගාරයේ කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී ඇත. | පටක රෝපණ විද්‍යාගාරය ඉදිකිරීම් වැඩ අවසන් කර අත්තිකාරම් ගිණුම් කටයුත්තේ අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.19 විෂයය අංක 25102 - "ගොවිපල කටයුතු මෙහෙයවීම හා බිත්තර වී සැපයීම"**

**1.5.19.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.2,085,402 ක් වූ අතර, දීර්ඝ කාලයක සිට අය නොවන ණය ශේෂ හඳුනාගැනීමට හැකිවන පරිදි ණයගැති කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් නොවුණි. | සමාලෝචිත වර්ෂයෙහි දෙසැම්බර් 31 දිනට පවතින ණයගැති ශේෂය සඳහා ණයගැති කාල විශ්ලේෂණ පිළියෙල කරනු ඇත. | ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.19.2 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ සිට පැවති රු.499,458 ක ණයහිමි ශේෂය පියවීමට කටයුතු කර නොතිබුණි. | වසර ගණනාවක් ආපස්සට තොරතුරු සොයා බැලූ අතර එම තොරතුරු පිළිබඳ සාක්ෂි සටහන් සොයා ගැනිමට නොහැකි වි ඇත. | ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.19.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි 02 දින වැඩ අවසන් කර භාරදී තිබුණු රු.3,662,756 ක් වටිනා ලූණු ගබඩාව සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අදාළ කාර්යය සඳහා භාවිතයට ගෙන නොතිබුණි. | ගොවින් ඇණු වගාවෙන් ඉවත් වීම හා වෙළඳ පල තුළ අස්වැන්න සඳහා ඉහල මිලක් පවතින විට අස්වැන්න ගබඩා කිරීමක් සිදු නොවීමත් මෙයට හේතු වී ඇත. | අවශ්‍යතාවයන් හඳුනාගෙන ඉදිකිරීම් කළ යුතුය. |

**1.5.20 විෂයය අංක 26002 - වාරියපොළ පුහුණු ආයතනයේ කටයුතු පවත්වාගෙන යාම**

**1.5.20.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වයඹ පුහුණු ආයතනයේ පිහිටි "පැහැසර" භෝජනාගාරය 2020 වසරේ සිට නිශ්කාර්යව පවතින අතර විගණන අවස්ථාව වූ 2023 පෙබරවාරි 15 දින වන විට භෝජනාගාරය හා ඇතුළත මුලුතැන්ගෙය නඩත්තු කටයුතු සිදු නොවීම හේතුවෙන් අනාගතයේ දී ප්‍රයෝජනයට ගත නොහැකි පරිදි අබලන් තත්ත්වයට පත්වී තිබුණි. | ඉදිරියේ දී පැහැසර භෝජනාගාරය පිරිසිදුකර පුහුණුලාභීන් සඳහා භාවිතා කිරීමට කටයුතු කරනු ඇත. | වත්කම් අදාළ කාර්ය සඳහා යෙදවිය යුතුය. |
| (ආ) | නේවාසිකාගාර භාරකරු තනතුර ආයතනය සඳහා අනුමත වී තිබුණද, එම තනතුරු පුරප්පාඩු වීම නිසා නේවාසිකාගාර අධීක්ෂණය හා පාලන කටයුතු ද, විදුලි කාර්මික, කාර්යාල කාර්ය සහයක, කම්කරු තනතුරු 06 ක් පුරප්පාඩුවීම හේතුවෙන් පුහුණු ආයතනයේ විදුලි නඩත්තු කටයුතු, භූමිය දෛනිකව පිරිසිදු කර අලංකාර කිරීම, නඩත්තු කිරීම, නිල නිවාස හා නේවාසිකාගාර පිරිසිදු කිරීම වැනි කටයුතු ද, නිසි අයුරින් කිරීමට අපහසු වී තිබුණි. | ඉදිරියේ දී මෙම අඩුපාඩු සපුරා ගැනීමට කටයුතු කරනු ලැබේ. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.21 වයඹ පළාත් කර්මාන්ත සේවා කාර්යංශය

#### 1.5.21.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයිතම 09 ක් යටතේ දීර්ඝකාලයක සිට පැවත එන ලැබිය යුතු ශේෂයන් රු.4,252,309 ක් විය. | අයකර ගැනීමට ඇති මුදල් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට හා ගැලපුම් කළ යුතු ශේෂ හඳුනාගෙන ගිණුම් ගැලපීම් කිරීමටත් කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂයන් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

#### 1.5.21.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වගකීම් අයිතම 05 ක් යටතේ දීර්ඝකාලයක සිට පැවත එන ගෙවිය යුතු ශේෂයන් රු.1,748,508 ක් විය. | අදාල ශේෂයන් නැවත වරක් සනාථ කරගැනිමෙන් පසුව නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවිය යුතු ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.22 වයඹ පළාත් පරිසර අධිකාරිය

#### 1.5.22.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1990 අංක 12 දරන වයඹ පළාත් පාරිසරික ප්‍රඥප්තියේ 21(2) සහ 21(3) ප්‍රකාරව පාරිසරික ආරක්ෂණ බලපත්‍රය වලංගු කාලය නිශ්චිතව සඳහන් වියයුතු අතර, එකවර ලිත් වර්ෂයක් ඉක්මවා බලපත්‍රයක් නිකුත් නොකළ යුතු අතර, පළාත් පරිසර අධිකාරිය නිකුත් කරනු ලබන සෑම පාරිසරික ආරක්ෂණ බලපත්‍රයකම වලංගු කාලය අවසන්වීමෙන් පසු නැවත අලුතින් බලපත්‍රයක් ලබාගැනීම හෝ අලුත්කර ගැනීමක් සිදු කරනු ලබනවාද යන්න පරීක්ෂා කිරීමට හැකිවන පාලන ක්‍රමවේදයක් නොවීය. | මේ වන විට අප ආයතනයේ බලපත්‍ර නිකුත් ක්‍රියාවලිය පරිගණක ගතකර ඇති බැවින් බලපත්‍රයක වලංගු කාලය ඉක්මවීමට මසකට පෙර අදාල ව්‍යාපාර හිමිකරුට ජංගම දුරකථනයට දත්ත පද්ධතිය හරහා කෙටි පණිවිඩයක් මගින් බලපත්‍රය අලුත් කිරිමට අවශ්‍ය බව දැනුම් දීමක් සිදු කරනු ලබයි. | පරිගණක පද්ධතියේ පවතින තොරතුරු පරීක්ෂා කිරීම සඳහා අවස්ථාව පැවතිය යුතු අතර, එහි ක්‍රියාකාරීත්වය නිරන්තරයෙන් පරීක්ෂා කළ යුතුය. |

**1.5.23 වයඹ ජනකලා පදනම**

**1.5.23.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ---------------------------------- | ------------ |
| (අ) | පදනම විසින් නැටුම් සංගීත වැනි දේශීය කලාවන් සඳහා පවත්වන පෞද්ගලික පන්ති සඳහා පූර්ව වර්ෂ වල ප්‍රවීණ ගුරුවරුන් ආයතන මට්ටමින් ලබාගෙන උපකාරක පන්ති පවත්වා ආදායම් උත්පාදනය කර තිබූ නමුත් මේ වන විට එම පරිශ්‍ර පෞද්ගලික අංශයට ලබා දී බිම් කුලියක් පමණක් ලබා ගනිමින් පැවතුණි. | පාඨමාලා පැවැත්වීම තුළින් සැළකිය යුතු ආදායමක් නොලැබීම හේතුවෙන් එම සංගීත කාමරය බදු කුලී පදනම යටතේ ලබා දී ඇත. | ගුණාත්මක පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | හලාවත විස්කම් පියස පවත්වාගෙන යාම සඳහා හලාවත නගර සභාව විසින් ගාස්තු අය කිරීමකින් තොරව ලබා දී ඇති ගොඩනැගිල්ලෙහි වෙළඳසැලක් පවතින බවට දැන්වීම් පුවරු මගින් ප්‍රචාරණය කර ආකර්ශණීය අලෙවිසැලක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | කාලෝචිත අලෙවි ප්‍රවර්ධන ක්‍රම ඉදිරියේදී අනුගමනය කිරීමට සැලසුම් කර ඇත. | පාරිභෝගික ආකර්ශණය ලබාගත හැකි තත්ත්වයට පත් කළ යුතුය. |

**1.5.24 වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය**

**1.5.24.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ---------------------------------- | ------------ |
| කුලී ගාස්තු, වාහන අළුත්වැඩියා ගාස්තු, සේවා මධ්‍යස්ථාන ගාස්තු හා සිවිල් වැඩ ගාස්තු ලෙස රු.48,276,393 ක් වූ ලැබිය යුතු ආදායම් වලින් වසර 05 කට වැඩි කාලයක සිට නිරවුල් නොකර පවතින ශේෂවල එකතුව රු.8,885,039 ක් විය. | අදහස් දැක්වීමක් කර නොමැත. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.24.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ---------------------------------- | ------------ |
| දේශීය ආදායම් පනත ප්‍රකාරව නිශ්චිත ගාස්තු මත අයකල බදු මුදල් අයකල | ආයතනයේ වර්තමානයේ පවතින මූල්‍ය දුෂ්කරතා නිසා | හිඟ බදු නිරවුල් කිරීමට හා නියමිත කාල සීමාව තුළ බදු |

| | | |
|---|---|---|
| මසට පසුව එළඹෙන මාසයේ 15 දින හෝ පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු වුවත්, 2021 හා ඊට පෙර වර්ෂවලට අදාළව ගෙවිය යුතු එකතුව රු.9,860,836 ක බදු මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මගහැරී ඇති අතර, ගෙවීමට පවතින ඉතිරි මුදල වාරික හයකින් ගෙවීමට කටයුතු කරනු ලැබේ. | ගෙවීමටත් කටයුතු කළ යුතුය. |

**1.5.25 වයඹ සංවර්ධන අධිකාරිය**

**1.5.25.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට ණයගැතියන් 09 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.3,095,595 ක් පැවති අතර මින් රු.1,122,997 ක් 2021 හා ඊට පෙර වර්ෂ වලට අදාළ විය. | කොටස් වශයෙන් හෝ අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අදාළ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.26 වයඹ පළාත් මානව සම්පත් සංවර්ධන අධිකාරිය**

**1.5.26.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ ගණනාවක සිට අධිකාරියට අයත් ජංගම ගිණුමක් අයිරා තත්ත්වයේ පැවතීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අයිරා පොළිය වශයෙන් රු.1,018,643 ක් ගෙවා තිබුණි. එහෙත් ඉතුරුම් ගිණුම් 04 ක සමාලෝචිත වර්ෂය අවසානයට රු.66,028,930 ක ශේෂයක් විය. | මෙම ගිණුම ආරක්ෂක හා පවිත්‍රතා අංශයන් වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන අතර ඒකී සේවාවන් ලබා ගන්නා ආයතන විසින් නියමිත කාලය තුළ මුදල් නොගෙවීම මීට හේතු වී ඇත. | අංශ අතර මුදල් කළමනාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.26.2 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය සඳහා මෘදුකාංග පද්ධතිය නිර්මාණය කිරීමට 2021 මාර්තු 31 දින වන විට නිමකිරීමට රු.1,485,000 ක මුදලකට පුද්ගලික ආයතනයක් සමඟ | නැවත ගිවිසුම් ගතවීමට කටයුතු කරනු ලැබේ. | අවශ්‍ය මොඩියුල නොපමාව සකස් කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ගිවිසුම්ගතව අත්තිකාරම් ලෙස රු.445,500 ක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ගිවිසුම්ගත මුදල රු.620,000 ක් වූ Module 03, 04 හා 05 යන කොටස් සම්පූර්ණ කර නොතිබුණි. | | |

**1.5.26.3 ලැබිය යුතු ගිණුම්**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | 2008 සිට 2022 කාලපරිච්ඡේදය තුළ තනි පුද්ගල ව්‍යාපෘතීන් සඳහා ණය ප්‍රතිලාභීන් 20 දෙනෙකු වෙත ලබා දී තිබුණු රු.37,000,000 ක ණය මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කිසිදු වාරිකයක් හෝ පොලී මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු හිඟ මුදල් අයකර ගැනීමට අවස්ථා කිහිපයකදී ලිඛිත දැනුම්දීම් සිදුකර ඇත. නමුත් මේ දක්වා එම හිඟ මුදල් අයවී නොමැති බැවින් නැවත සියලු ආයතන / පුද්ගලයින් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. |
| **(ආ)** | අධිකාරියේ ක්‍රියාකාරී ණය වර්ග 10 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟව පැවති ණය ශේෂයන් හි එකතුව රු.54,763,658 ක් විය. | ණයකරුවන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග නොපමාව ගත යුතුය. |

**1.5.26.4 ආදායම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | අධිකාරියේ ප්‍රධාන මෙහෙයුම් ආදායම වන ආරක්ෂක හා පවිත්‍රතා සේවාවේ පිළිවෙළින් රු.56,199,439 ක් හා රු.129,958,953 ක් ලැබිය යුතු ආදායමක් සමාලෝචිත වර්ෂය අවසානයට පවතින අතර එයින් වර්ෂයට වඩා වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් පිළිවෙළින් රු.27,990,352 ක් හා රු.13,319,075 ක් විය. | මින් බොහෝමයක් පළාත් සභා ආයතන වන අතර ඒ පිළිබඳව පළාත් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කරමින් ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | අධිකාරිය යටතේ පාලනය වන මහගෙදර සංචාරක නිකේතනය වෙත වසර පහකට වැඩි කාලයක සිට අයවිය යුතු රු.262,500 ක් හා වසර 1 ත් 5 ත් අතර කාලයක සිට | මේ දක්වා එම හිඟ මුදල් අයවී නොමැති බැවින් නැවත සියලු ආයතන/පුද්ගයින් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

අයවිය යුතු රු.220,605 ක් හා 2022 වර්ෂයට අදාළව රු.33,500 ක් වශයෙන් එකතුව රු.516,605 ක ලැබිය යුතු ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානයට විය.

### 1.5.27 වයඹ පළාත් පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

#### 1.5.27.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 අංක 04 දරන වයඹ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ IV වැනි උපලේඛණයේ පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන ආයතන අධීක්ෂණය හා නියාමනයෙහි 02 ඡේදය ප්‍රකාරව ඒකාකාරී මට්මින් හා ආයතන වල ගුණාත්මකභාවය වර්ධනය වන අන්දමින් පවත්වාගෙන යාම සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කර ඇති නිර්දේශ ඇතුළත් ආකෘති පත්‍රයක් මගින් අධීක්ෂණය හා නියාමනය කළ යුතු වුවත්, 2018 වර්ෂයෙන් පසුව එලෙස සිදුකර නොතිබුණි. | මේ වන විට පෙර පාසල් අධීක්ෂණය සඳහා මෙම ආකෘති පත්‍රය නිලධාරීන්ට ලබා දී ඒ අනුව පෙර පාසල් අධීක්ෂණ කටයුතු කරනු ඇත. | පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන ආයතන අධීක්ෂණය හා නියාමනය අඛණ්ඩව සිදුකළ යුතුය. |

### 1.5.28 වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

#### 1.5.28.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වයඹ පළාත් මාර්ගස්ථ මගී සේවා ප්‍රඥප්තියේ 17 වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004 ජනවාරි 16 දින ගැසට් පත්‍රයේ පලකරනු ලබන නියෝග හා සංශෝධන අනුව වයඹ පළාත තුල මගී ප්‍රවාහන අවශ්‍යතාවයන් අධීක්ෂණය කිරීමෙන් පසු නිත්‍ය බස් සේවා අවශ්‍යවන මාර්ගයන් නිශ්චය කිරීම හා විවෘත අවම ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය මඟින් බලපත්‍රධාරීන් තෝරාගැනීම කළ යුතුය. එහෙත් එලෙස කටයුතු නොකර මාර්ග බලපත්‍ර ලබාදුන් අවස්ථා විය. | මෙම මාර්ග බලපත්‍ර සම්බන්ධව අල්ලස් හා දූෂණ කොමිෂම මගින්ද පරීක්ෂණ කටයුතු සිදුකර නැවත ආයතනය වෙත ලබා දී ඇත. | මාර්ග ලබපත්‍ර ලබාදීම පවත්නා නීතී,රීතී වලට අනුකූලව සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2011 වසරේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා නව මාර්ග බලපත්‍ර ලබාදීමේදී වසර 05 ක කාලයකට සීමා කර බලපත්‍ර ලබාදී තිබුණි. ඉන් පසුව මාර්ග බලපත්‍ර ලබාදීම් සියල්ලක්ම එකී සීමා නියමයකින් තොරව ලබා දී තිබුණි. 2011 වසරේදී වසර 05 ක කාල සීමාවක් සඳහා ලබාදුන් මාර්ග බලපත්‍ර 40 ක් පමණක් බලපත්‍ර කාලසීමාව අවසානයේ නැවත නැවත ටෙන්ඩර් කලේනම් අධිකාරියට රු.38,575,400 ක් පමණ ආදායමක් උපයාගත හැකිව තිබුණි. | 2016 වර්ෂයෙන් පසු නව මාර්ගපත්‍ර ටෙන්ඩර් කිරීමේදි මෙම කොන්දේසිය ඉවත් කර ඇත. | මාර්ග බලපත්‍ර ලබාදීම පවත්නා නීතී,රීතී වලට අනුකූලව සිදුකළ යුතුය. |
| (ඇ) | 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලය සඳහා අධිකාරිය වෙත ලැබිය යුතු හිඟ මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු හා හිඟ මාසික පිවිසුම් පත්‍ර ගාස්තුව පිළිවෙලින් රු.15,899,000, රු.2,885,400 ක් වූ අතර, ඊට අදාල ප්‍රමාද ගාස්තුව පිළිවෙලින් රු.3,238,600 ක් හා රු.494,600 ක් ද විය. | හිඟ ශේෂ අයකර ගැනීමට ඉදිරියේ දී කටයුතු සිදුකරනු ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදයට අදාලව අධිකාරියට ලැබිය යුතු අමතර ගමන්වාර ආදායම රු.4,218,000 ක් හා ඊට අදාල ප්‍රමාද ගාස්තුව රු.1,139,700 ක් විය. | මෙම හිඟ ආදායම් ගෙවීමට ඇති බස්රථ වැඩි ප්‍රමාණයක් බස් ව්‍යාපාරයෙන් ඉවත්වී ඇති බැවින් හිඟ ආදායම් අයකර ගැනීම අපහසු වී ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාලව අධිකාරිය වෙත ලැබිය යුතු නව බලපත්‍ර සේවා ගාස්තු ආදායම රු.4,771,000 ක් විය. | මෙම නව බලපත්‍ර ගාස්තු ආදායමෙන් රු1,996,000 ක මුදලට අදාල මාර්ග බලපත්‍ර මේ වන විට අවලංගු වී ඇති අතර, එම ගාස්තු අයකර ගැනීමට නොහැකි වී ඇත. 2020 හා 2022 වර්ෂයන්ට අදාල රු2,775,000 ක මුදලින් රු.2,175,000 ක් මේ වන විට අයවී ඇත. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | රියදුරු හා කොන්දොස්තර බලපත්‍ර නිකුත්කිරීමේදී අධිකාරියේ ලියාපදිංචි බස්රථ සංඛ්‍යාව පිළිබඳව සැලකිල්ල දක්වා නොතිබීම හා බලපත්‍ර නොමැති බස් රථ සේවක මහතුන් සඳහා ජංගම පරීක්ෂක අංශයෙන් දඩ නියම නොකිරීම හේතුවෙන් බස් රථ සේවකයන් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු නොකිරීම නිසා අධිකාරියට වාර්ෂිකව අහිමි වන ආදායම රු.3,591,100 ක් පමණ විය. | මේ වනවිට ජංගම පරීක්ෂණ අංශය මඟින් බස් රථ පරීක්ෂාවන් සිදුකරනු ලැබේ. | සියලුම බලපත්‍රලාභී බස්රථ සඳහා රියදුරු කොන්දොස්තර බලපත්‍ර ලබාගෙන ඇති බව තහවුරු කරගත යුතුය. |
| (උ) | රියදුරු හා කොන්දොස්තර බලපත්‍ර පිළිවෙලින් වර්ෂ 02 කට හා 03 කට වරක් අළුත් කලයුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. එලෙස බලපත්‍ර අළුත්කලේ නම් අයකරගත යුතුව තිබූ ආදායම රු.896,800 ක් පමණ විය. | මේ වනවිට ජංගම පරීක්ෂණ අංශය මඟින් බස් රථ පරීක්ෂාවන් සිදුකරනු ලැබේ. | බලපත්‍ර අළුත්කරගෙන නොමැති අවස්ථා හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2012 ඔක්තෝබර් 15 දිනැති අංක 17580 / 05 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 16 (ඒ) අනුව නව බලපත්‍ර නිකුත් කිරීමේදී බලපවත්වන කොන්දේසි ආරක්ෂා කිරීම පිණිස රු.10,000 ක ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදලක් අයකර ගත යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා නිකුත් කර ඇති බලපත්‍ර 1426 ක් සඳහා ලබාගත යුතු රු.14,260,000 ක ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | එම කාර්යය මෙතෙක් සිදුකර නොමැති අතර ඉදිරියේදි මාර්ග ටෙන්ඩර් කර නව බලපත්‍ර ලබාදීමේදි අදාල මුදල් අයකර ගැනිමට කටයුතු කරනු ලැබේ. | සියළුම බලපත්‍ර සඳහා ඇප තබාගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.28.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා රු.18,215,169 ක් වැය කොට මාර්ග අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන හා මෙහෙයවීම යටතේ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සඳහා ස්ථාපිත කර පැවති පරිගණක ආශ්‍රිත මෙහෙයුම් පද්ධතියෙහි ඇතුලත් මුදල් ලැබීම්, | පද්ධති යාවත්කාලීන කිරීමට අදාළ උපදෙස් මේවන විට අධිකාරිය මගින් අදාළ නිලධාරීන්ට ලබාදී ඇත. | පද්ධතියේ පවත්නා අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම සම්බන්ධ කටයුතු සිදුකිරීම එකී පද්ධතිය හරහා ක්‍රියාත්මක නොවීම, මාර්ග බලපත්‍ර, ලොග් පත්‍ර ආදිය සම්බන්ධව ගෙවීම්, ස්වයංක්‍රියව තහවුරු නොවීම, උපකාර්යාල වලට අදාළව සිදුකල දඩ පත්‍රිකා නිවැරදි නොවීම, වැනි අඩුපාඩු විය. | | |

**1.5.28.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | -------------------------------- | ------------ |
| (අ) | අධිකාරියේ හිටපු සභාපතිවරයකුගෙන් අධ්‍යක්ෂ දීමනා, ඉන්ධන දීමනා වැඩිපුර ගෙවීම වෙනුවෙන් රු.1,325,705 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයකර ගැනීමට පැවතුණි. | වයඹ පළාත් සභාවේ නීති අංශය වෙත යොමුකර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | අදාළ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | අධිකාරිය විසින් නව බලපත්‍ර නිකුත් කිරීමේදී බස්රථ හිමියන් අධිකාරියේ නීති රීති රෙගුලාසිවලට අනුව කටයුතු කරන බවට දිවුරුම් ප්‍රකාශයක් ලබාගනු ලැබුවද බලපත්‍රයේ හිමිකරු වෙනස්වන විට එවැනි දිවුරුම් ප්‍රකාශයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බලපත්‍රයේ හිමිකරු වෙනස් වන විට දිවුරුම් ප්‍රකාශයක් ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | දිවුරුම් ප්‍රකාශ ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.28.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | -------------------------------- | ------------ |
| අධිකාරියේ 2013 ඔක්තෝබර් 29 දිනැති බඳවා ගැනීම් පටිපාටියේ 5.4 ඡේදයේ දක්වා ඇති බඳවාගැනීම් ක්‍රමවේදයට අනුකූල නොවන ආකාරයට 2018 සිට 2022 කාල පරිච්ඡේදය තුල කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) සේවා ගණය සඳහා 08 දෙනෙකු හා ප්‍රාථමික සේවා ගණය සඳහා 06 දෙනෙකු අධ්‍යක්ෂ මණ්ඩලයේ හා සභාපතිවරයාගේ අභිමතය පරිදි බඳවාගෙන තිබුණි. | ඉදිරියේදි කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවා ගැනීම් සිදුකරනු ලැබේ. | බඳවාගැනීම් පටිපාටියට අනුකූලව කටයුතු කළ යුතුය. |

**1.5.29 වයඹ පළාත් ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය**

**1.5.29.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2005 වර්ෂයේදී රු.6,137,000 ක් වැය කර ආරම්භ කර තිබූ සින්නපාඩුව අභිජනනාගාර ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී බාහිර පාර්ශවයකට බදුදී තිබුණද, 2017 වර්ෂයේ සිට ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබූ අතර එදින සිට ගොඩනැගිලි සහ උපකරණ අභාවයට යමින් පැවතුණි. එමෙන්ම බදු දුන් කාලයට අදාළ හිඟ මුදල රු.480,000 ක් විය. | බදු පදනම මත ලබාදීම සඳහා සුදුසු පුද්ගලයෙකු තෝරාගෙන ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඉදිරියේදී බදු පදනම මත ලබා දීමට කටයුතු කරනු ලැබේ. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කළ යුතුය. |
| (ආ) | 2007 වර්ෂයේ රු.875,000 ක් වැය කර ආරම්භ කළ මුන්දලම සංචාරක නිරීක්ෂණ මධ්‍යස්ථානය සමාලෝචිත වර්ෂය වන විට අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි. | ටෙන්ඩර් කළද බදුකරුවන් ඉදිරිපත් නොවීම මීට හේතු වී ඇත. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි කටයුතු කළ යුතුය. |
| (ඇ) | අධිකාරි පරිශ්‍රය පිහිටි ඉඩමේ මත්ස්‍ය තටාකාංගනය ඉදිකිරීම වෙනුවෙන් 2008 වර්ෂයේදී රු.4,925,000 ක් වැයකර තිබුණද ව්‍යාපෘතියේ ඉදිරිකිරීම් කටයුතු අතරමඟ නවතා තිබූ අතර, එකී ඉදිකිරීම්ද වර්තමානය වන විට ප්‍රයෝජනයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබුණි. | මෙම මත්ස්‍ය තටාකාංගන අත්තිවාරම මත නැවත ඉදිකිරීමක් කිරීමට සුදුසු මට්ටමක නොපවතින බැවින් මෙම ටැංකි කොටස් පස් පුරවා එම බිම් ප්‍රදේශය අධිකාරියේ ප්‍රයෝජනයට ගත හැකි ලෙස සකස් කර ඇත. | ව්‍යාපෘති නිසි සක්‍යතා අධ්‍යයනයකින් පසු ආරම්භ කර සැලසුම් කළ පරිදි පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | ඉස්සන්ට වැළදෙන සුදු පුල්ලි වෛරස් රෝග පාලනය සඳහා රු.7,511,710 ක පිරිවැයක් දරා ආරම්භ කර තිබුණු "PCR" විද්‍යාගාරයෙහි 2018 වර්ෂයේ සිට රසායනාගාර කටයුතු නවතා තිබුණි. | ඉස්සන් වගාවට කාලීනව පැවති බාධා හා සීමා වීම්, රසායනාගාර අතර තරගකාරීත්වය වැනි හේතුමත ප්‍රමාණවත් ආදායමක් උපයා ගැනීමට නොහැකිවීම නිසා රසායනාගාර කටයුතු අපේක්ෂිත ඉලක්කය කරා ළඟා වීමට නොහැකිවිය. | ව්‍යාපෘති සැලසුම් කළ පරිදි පවත්වාගෙන යෑමටත්, අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 1.5.29.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2007 හා 2008 වර්ෂවල ආරම්භ කරන ලද මත්ස්‍ය සැකසුම් ව්‍යාපෘතිය ආරම්භයේ සිටම අකර්මණ්‍යව තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට.රු.4,140,000 ක් වටිනා ගොඩනැගිල්ල නිශ්කාර්යව පැවතුණි. | මෙම ව්‍යාපෘතියට අදාළ වත්කම් වලින් මේ වන විට නිශ්කර්යව පවතින්නේ එයට අයත් ගොඩනැගිල්ල පමණක් විය. | ගොඩනැගිල්ල නිශ්චිත කාර්යයකට යෙදවීමට කටයුතු කළ යුතුය. |

### 1.5.29.3 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිකාරියට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.4,530,776 ක් විය. ඒ තුළ වනසංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු වසර 05 ඉක්ම වූ රු.2,150,000 ක් ද විය. | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවෙන් හා ආරච්චි කට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අයවිය යුතු මුදල පිළිවෙලින් රු.2,150,000 ක් හා රු.114,850 ක් සඳහා ඒ ආයතන වෙත දැනුම් දී ඇතත් යහපත් ප්‍රතිචාරයක් ලැබී නොමැත. E7 ලංකා පුද්ගලික ආයතනයෙන් ලැබිය යුතු රු.480,000 සඳහා නීති උපදෙස් වලට යොමුකර ඇත. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.30 ප්‍රධාන අමාත්‍ය අරමුදල

### 1.5.30.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසරින් වසර පොළී මුදල් සමඟ අලුත් කරමින් සුනාමි තැන්පතු ස්ථාවර තැන්පත් ගිණුමක සමාලෝචිත වර්ෂය අවසානය වනවිට රු.8,384,823 ක ශේෂයක් පැවති අතර, මෙම මුදල් යෙදවීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන නොතිබුණි. | 2004 වර්ෂයේ ආරම්භ කර තිබූ මෙය මේ දක්වා පවතින අතර හෙළිදරව් වීමේ ක්‍රමවේදයක් නොමැති වීමෙන් මෙම අරමුදලේ පෙන්නුම් කිරීමක් පමණක් සිදුකර ඇත. | මහජන සේවය ඉටුකළ හැකි කාර්යයක යෙදවීමට කටයුතු කළ යුතුය. |

**1.5.31 වයඹ පළාත් ක්‍රීඩා අරමුදල**

**1.5.31.1මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1992 අංක 04 දරන වයඹ පළාත් ක්‍රීඩා ප්‍රඥප්තියට අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වල ක්‍රීඩා සහ ශාරීරික අධ්‍යාපන නගා සිටුවීම, සංවර්ධනය කිරීම, උනන්දු කරවීම සහ පාලනය කිරීම අරමුණු කරගෙන ප්‍රාදේශීය ක්‍රීඩා බල මණ්ඩල පිහිටුවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂ තුළ එලෙස කටයුතු කර නොතිබුණි. | 2023 වසරේ සිට ප්‍රාදේශීය ක්‍රීඩා බල මණ්ඩල පිහිටුවීමට කටයුතු කර ඇත. | ප්‍රාදේශීය ක්‍රීඩා බල මණ්ඩල පිහිටුවීමට කටයුතු කළ යුතුය. |

**1.5.32 වයඹ පළාත් සමූපකාර සංවර්ධන අරමුදල**

**1.5.32.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදල මගින් සමූපකාර සමිති වෙත ලබා දී තිබූ ණය මුදල් වලින් වර්ෂය අවසන් වන විට ණය ගෙවීම නවතා තිබූ සමිති 16 කින් සමාලෝචිත වර්ෂය අවසානයට අරමුදලට අයවිය යුතුව පැවති හිඟ ණය ශේෂය රු.26,591,409 ක් වූ අතර, ණය මුදල් හිඟව පවතින කාලය වසර 01 ත් 22 ත් අතර විය. | මෙම සමිති වලින් බොහෝමයක් අක්‍රිය හා ඈවර මට්ටමේ පවතින සමිති වන බැවින් ණය අය කර ගැනිමට අපහසු වී ඇත. නමුත් දිගින් දිගටම ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගනු ලැබේ. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.33 වයඹ පළාත් සමූපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය**

**1.5.33.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ගනුදෙනු ඇතුළු විස්තර පරිගණකගත කිරීම සඳහා වැඩසටහනක් පිළියෙල කිරීමට 2010 වර්ෂයේදී වයඹ පුහුණු ආයතනය සමඟ රු.672,000 ක ගිවිසුමකට එළඹ තිබූ අතර ඒ සඳහා අත්තිකාරම් වශයෙන් රු.168,000ක් | වයඹ පුහුණු ආයතනය විසින් අදාල මුදල් ගෙවා නිම නොකරන්නේ නම් ගිවිසුම් ප්‍රකාරව නීති මඟින් කටයුතු කරනු ලැබේ. | මුදල් අයකර ගැනීමටත් පරිගණක වැඩසටහන කඩිනමින් සකස්කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගෙවා තිබුණ ද අදාළ කාර්යය ඉටුකිරීම වයඹ පුහුණු ආයතනය විසින් අතහැර දමා තිබුණි. වර්ෂය අවසානයට එම අත්තිකාරමෙන් තවදුරටත් ලැබිය යුතු මුදල රු.140,000ක් විය. | | |

**1.5.34 වයඹ පළාත් නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදල**

**1.5.34.1මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **------------------------** | **--------------------------------** | **------------** |
| වයඹ නිවාස සහ ඉදිකිරීම් සංවර්ධන අරමුදලේ කටයුතු කරනු ලබන නිලධාරීන් සඳහා රු.236,000 ක දීමනා සමාලෝචිත වර්ෂයේදී නිවාස සහ ඉදිකිරීම් අරමුදලින් ගෙවා තිබුණි. | නිවාස දෙපාර්තමේතුවේ සේවයේ නියුතු අරමුදලට අදාල වන රාජකාරි සඳහා යොදවාගත් නිලධාරීන්ට පාලක මණ්ඩල අනුමැතිය ප්‍රකාරව දීමනා ගෙවනු ලැබේ. | විධිමත් අනුමැතියක් ලබාගත යුතුය. |

**1.5.35 වයඹ දිරිය නිවාස ණය යෝජනා ක්‍රමය**

**1.5.35.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **-----------------------** | **-------------------------------** | **---------------** |
| වයඹ දිරිය චක්‍රීය ණය යොජනා ක්‍රමයට අදාළ අවබෝධතා ගිවිසුම ප්‍රකාරව ණය වාරික හා පොලී අය කිරීම උකස් හා ආයෝජන බැංකුව මගින් සිදුකළ යුතුව ඇත. එහෙත් චක්‍රීය නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දී ඇති ණය ලාභීන් 156 දෙනෙකුගෙන් ණය වාරික 01 සිට 57 දක්වා පරාසයක වූ රු.8,552,065 ක් විය. | අරමුදලට අදාළව ලැබිය යුතු මුදල් වයඹ දිරිය චක්‍රීය ණය යොජනා ක්‍රමයට බැර කිරීමට හැකිවන ලෙස නීති සංශෝධන කිරීමට යෝජනා කර ඇත. | අදාළ නීති සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.36 වයඹ පළාත් කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන චක්‍රීය ණය අරමුදල**

**1.5.36.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **-----------------------** | **-----------------------------------** | **-----------** |
| කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන චක්‍රීය අරමුදල මගින් ලබාදුන් ණය යටතේ යම් | බැංකුව වෙත වාරික හා පොලී නොගෙවුවද අරමුදල වෙත | කාල විශ්ලේෂණ පිළියෙල කළ යුතුය. |

| | | |
|---|---|---|
| නිශ්චිත දිනකට කල් ඉකුත් වූ හෝ අයවීමට හිඟ හිට ඇති ණය පිළිබඳව තොරතුරු හඳුනාගැනීමක් සිදුකර නොතිබුණ අතර, මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට චක්‍රීය ණයගැති ශේෂය රු.72,178,374 ක් විය. | බැරවිය යුතු වාරික හා පොලිය බැංකුව විසින් අරමුදලට ලබා දීමට බැඳී ඇත. | |

**1.5.37 වයඹ පළාත් ධීවර චක්‍රීය ණය යෝජනා ක්‍රමය**

**1.5.37.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------------- | --------------- |
| ධීවර සවිය චක්‍රීය අරමුදල ආරම්භ කිරිමට ප්‍රඥප්තියක් මගින් හෝ රීති මාලාවක් මගින් හෝ අනුමැතියක් නොමැතිව 2008 වර්ෂයේ සිට ක්‍රියාත්මක කර තිබුණි. | චක්‍රීය ණය අරමුදල සඳහා කෙටුම්පත් කරන ලද රීති මාලාව දෙවන වර සංශෝධනයෙන් පසු අනුමත කර ගැනීම සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලය මගින් ආණ්ඩුකාරවර කාර්යාලය වෙත යොමු කර ඇත. | අරමුදල ආරම්භ කිරීමට වයඹ පළාත් සභාවෙන් අනුමැතිය ලබාගත යුතුය. |

**1.5.37.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ------------------------ | ------------------------------- | --------------- |
| ප්‍රතිමූල්‍ය ණය සඳහා මාසිකව පොලිය ගණනය කර කාර්තු වශයෙන් චක්‍රීය අරමුදලට බැරකර ඇති පොලියේ නිවැරදි බව තහවුරු කිරීමට අවශ්‍ය තොරතුරු බැංකුව විසින් ඉදිරිපත් කර නොතිබුණු අතර, අරමුදල මගින්ද කාර්තු වශයෙන් බැරකර ඇති පොලියේ නිවැරදිතාවය තහවුරු කර ගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | බැංකුව විසින් ධීවර චක්‍රීය ණය අරමුදල යටතේ ලබා දී ඇති ප්‍රතිමූල්‍ය ණය සඳහා අයකරන ලද පොලිය සම්බන්ධ නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ගණනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. | චක්‍රීය අරමුදලට නිවැරදිව පොලිය බැරවන බව තහවුරු කරගැනීමට ක්‍රමවත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |

**1.5.38 වයඹ පළාත් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදල**

**1.5.38.1 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ සුළු වාරිමාර්ග නඩත්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු මුදල රු.16,415,846 ක් විය. | වැව් නඩත්තු කටයුතු ඉටුකර තිබේද යන්න නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | වැව් නඩත්තු කටයුතු අඛණ්ඩව සිදුකිරීමට මුදල් නියමිත දිනට ගෙවිය යුතුය. |